# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට පසිද්ධකරණලදී.

අංක. 8,833—1941ක්වූ දෙසැම්බර් මස 19 වෙනි දිනට සිකුරාද.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

---

### කැලෑ ආඥාපණත යටතේ දැන්වීම.

දකුණු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසිනි.

**කැලෑ ආඥාපණතේ (311වෙනි පරිච්ඡේදය) 4 (1) වෙනි වගන්තිය යටතේ දැන්වීම.**

වර්ෂ 1941ක්වූ ඔක්තෝබර් මස 3වෙනි දින අංක 8,798 දරණ ආණ්ඩුවේ "ගැසට්" පත්‍රයේ ප්‍රසිද්ධකරණලද වර්ෂ 1941ක්වූ සැප්තැම්බර් මස 30වෙනි දින දරණ මෙහි පහත හැටියත් පිටපත්කරණලබන ප්‍රකාශපත්‍රයෙන් ඊට යාකරණලද උප ලේඛනයේ විස්තර සඳහන්වූ බිම්ප්‍රදේශය, කැලෑ ආඥාපණතේ 3වෙනි වගන්තිය (311වෙනි පරිච්ඡේදය) යටතේ වර්ෂ 1942ක්වූ ජනවාරි මස 5වෙනි දින සිට තහනම් කැලෑවක්යයි ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් ප්‍රකාශකරණලද බව සියලුදෙනාගේම දැනගැනීම පිණිස මෙයින් ප්‍රසිද්ධකරණු ලැබේ.

එබඳු කැලෑවක් තහනම් කැලෑවක් හැටියට වෙන්කිරීමෙන් ඇතිවන ප්‍රතිඵල මෙසේයි:—

එම කැලෑව ඇතුලත යම් කෙනෙක්—

(*a*) අවසර නැතුව හැසිරෙයිද, නැත්නම් හරකුන් අනාලේ කන්ට ඉඩහරිසිද;
(*b*) යම් ගහක් කැපීමේදී හෝ දව කැපීමේදී හෝ ඇදීමේදී හෝ නොසැලකිල්ලෙන් යම් අලාභහානියක් කරයිද;
(*c*) යම් ගහකින් කිතුල්මදයට පොතු උරප්පයිද, නැත්නම් කොලකඩයිද, නැත්නම් වෙන අන්දමකින් අලාභහානි කරයිද;
(*d*) වතුර කිළිම කරයිද;
(*e*) ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් පනවනලද යම් රෙගුලාසිවලට විරුද්ධව හරකුන්ට තණකමයිද, දඩයම්කරයිද, වෙඩිතියයිද, මසුන් අල්ලයිද, උගුල් මාගත් හෝ තුවක්කු බදියිද, මුරපලවල් හදයිද නොහොත් පාවිච්චිකරයිද නැත්නම් යම්කිසි පුපුරන ද්‍රව්‍යයක් පාවිච්චිකරයිද;

එම අය නීතියට විරුද්ධව වරදක් කළාවේ. එසේ වරදකාරයාවූවිට එම අය රුපියල් පනහක් දක්වා දඩයකට නොහොත් ඔහු විසින් කරණලද වරදින් සිදුවූ අලාභය රුපියල් විසිපහකට වැඩිනම් එබඳු අලාභය මෙන් දෙගුණයක දඩයකට යටහත්වේ.

යම් කෙනෙක්—

(*a*) එම කැලෑවේ අලුතෙන් බිම එළිකරයිද; නැත්නම්
(*b*) එම කැලෑවට ගිනිතියයිද, නැත්නම් ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් පනවනලද රෙගුලාසිවලට විරුද්ධව යම්කිසි ගින්නක් පත්තුකරයිද, නැත්නම් කැලෑවට හෝ ඉන් කොටසකට හානිවන අන්දමට යම් ගින්නක් පත්තුවෙන්ට හරියිද;

නැත්නම් එම කැලෑවේ—

(*c*) ඒ සම්බන්ධව විශේෂ බල ලැබූ කැලෑ නිලධාරියකු විසින් කලින් කලට දැනුම්දෙනු ලබන කාලවල් සහ ක්‍රමයන්ට එකඟ නොවෙනලෙස ගින්නක් පත්තුකරයිද, කබයිද නැතහොත් ගෙනයයිද;
(*d*) යම් ගහක් කපයිද, එහි වෑවේව පොතු අරියිද, අතු කපයිද, මදියිද නොහොත් පුළුස්සයිද;
(*e*) ගල් කඩයිද, හුනු හෝ අඟුරු පුළුස්සයිද, යම්කිසි ද්‍රව්‍ය සෑදීමට උවමනා දේවල් එකතුකරයිද, නැත්නම් කැලෑවෙන් උපදින ද්‍රව්‍ය පිටතට ගෙනයයිද;
(*f*) වැවීමට හෝ වෙන කටයුත්තකට බිම සුබකරයිද නැතහොත් කිදිද;
(*g*) යම්කිසි තාප්පයකට, අගලකට, බැම්මකට, වැටකට, බඩවැටියකට නොහොත් ඇදිවැටකට අනතුරුකරයිද, වෙනස්කරයිද නැතහොත් එය අහකට ගෙනයයිද;

එම අය නීතියට විරුද්ධව වරදක් කළාවේ. එසේ වරදකාරයාවූවිට එම අය හයමාසයක් දක්වා කාලයක්තුල සිරඅඩස්සියේ සිටීමට හෝ රුපියල් පන්සියය දක්වා දඩයකට හෝ ඒ දෙකටම යටහත්වේ. මේ හැර කැලෑවට කරණලද අලාභ සඳහා වරදකාරයා බව නිශ්චයකරණ උසාවිය නියම්කරණ යම් වන්දියක් ගෙවීමටද ඔහු යටත්වේ. එසේ ගෙවන්ට නියම්කරණලද වන්දිය සියලු අන්දමින්ම දඩයක්මෙන් සලකා එසේ අයකරණුලබනවත් හැර එම උසාවියට නියම්කරන්ට බලය තිබෙන මුළු දඩ මුදලට වැඩිවනු නොලැබේ.

වර්ෂ 1941ක්වූ දෙසැම්බර් මස 16වෙනි දින
ගාල්ලේ කච්චේරියේදීය.

ඩබ්ලිව්. ඕ. ස්ටීවන්ස්,
දකුණු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

යම් කෙනෙක්—

(1) එම කැලෑවේ අර්තෙත් බිම එළිකරයිද ; නැත්නම්

(2) එම කැලෑවට ගිනිතියයිද, නැත්නම් ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් පනවනලද රෙගුලාසිවලට විරුද්ධව යම්කිසි ගින්නක් පත්තුකරයිද, නැත්නම් කැලෑවට හෝ ඉන් කොටසකට හානිවන අන්දමට යම් ගින්නක් පත්තුවෙන්ටඅරියිද ;

නැත්නම් එම කැලෑවේ—

(3) ඒ සම්බන්ධ විශේෂ බල ලැබූ කැලෑ නිලධාරියෙකු විසින් කලින්කලට දන්වනලදුලබන කාලවල් සහ ක්‍රමයන්ට එකඟ නොවෙනලෙස ගින්නක් පත්තුකරයිද, තබයිද නැතහොත් ගෙනයයිද ;

(4) යම් ගසක්කපයිද, එහි වෑලි පොතුඅරියිද, අතුකපයිද, මදියිද, නොහොත් පුළුස්සයිද ;

(5) ගල්කඩයිද, හුණු හෝ අඟුරු පුළුස්සයිද, යම්කිසි ද්‍රව්‍ය සෑදීමට වුවමනා දේවල් එකතුකරයිද, නැතහොත් කැලෑවෙන් උපදින ද්‍රව්‍ය පිටතට ගෙනයයිද ;

(6) වැවීමට හෝ වෙන කටයුත්තකට බිම සුඩකරයිද, නැතහොත් බිඳියිද ;

(7) යම්කිසි තාප්පයකට, අගලකට, බැම්මකට, වැටකට, බඩවැටියකට නොහොත් ඇදිවැටකට අනතුරුකරයිද එය වෙනස් කරයිද, නැතහොත් අහකට ගෙනයයිද ;

එම අය නීතියට විරුද්ධව වරදක්කළා වේ. එසේ වරදකාරයාවූ විට එම අය හයමාසයක් දක්වා කාලයක් තුල හිරඅඩස්සියේ සිටීමට හෝ රුපියල් පන්සියය දක්වා දඩයකට හෝ දෙකටම යටත් වේ. මේ හැර කැලෑවට කරණලද අලාභ සඳහා වරදකාරයා බව තීන්දුකරණ උසාවිය නියමකරණ යම් වන්දියක් ගෙවීමටද බඳු යටත් වේ. එසේ ගෙවන්ට නියමකරණලද වන්දිය සියළු අනුමිත්ම දඩයක්මෙන් සලකා එසේ අයකරණුලබනවත් හැර එම උසාවියට නියමකරන්ට බලය තිබෙන මුළු දඩ මුදලට වැඩිවනුද නොලැබේ.

වර්ෂ 1941ක්වූ දෙසැම්බර් මස 16වෙනි දින ගාල්ලේ කච්චේරියේදීය.

ඩබ්ලිව්. ඕ. ස්ටීවන්ස්,
දකුණු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත වර්‍යා.

---

ආණ්ඩුකාර උතුමාණන් විසිනි.

ප්‍රකාශපත්‍රයයි.

**ඒ. කෝල්ඩිකොට්.**

සියල්ලෝම මෙයින් දැනගනිත්වා !

ලංකාණ්ඩුකාර උතුමානන්වහන්සේවූ ඇන්ඩෲ කෝල්ඩිකොට් වන මම්ම (311වෙනි පරිච්ඡේදයවූ) කැලෑ ආඥාපණතේ 3වෙනි වගන්තිය අනුව මෙයින් ප්‍රකාශකරන්නේ නම් :—

වර්ෂ 1897සිට වර්ෂ 1903 දක්වා පනවනලද මුඩුබිම් ආඥාපනත් යටතේ වර්ෂ 1911 දෙසැම්බර් 29වෙනි දින නිකුත් නො. 6,481 දරණ වර්ෂ 1909 මැයි මස 28වෙනි දින නිකුත් නො. 6,311 දරණ සහ වර්ෂ 1911 අප්‍රෙල් මස 28වෙනි දින නිකුත් නො 6,438ද දරණ ගැසට් පත්‍රවල පිටුවලින් ප්‍රසිද්ධකරනලද වර්ෂ 1911 නොවැම්බර් මස 4වෙනි දින නො. 636ද, වර්ෂ 1909 මාර්තු මස 20වෙනි දින නො. 279 සහ වර්ෂ 1911 මාර්තු මස 2වෙනිද නො. 505ද දරණ ආඥාවලින් සහ තංගල්ලේ දිස්ත්‍රික් උසාවියේ නො. 25 දරණ නඩු තීන්දුවේ සඳහන් වර්ෂ 1909 සැප්තැම්බර් මස 1වෙනි දින දරණ ආඥාවේන්ද රජසන්තක දේපලයයි ප්‍රකාශකරනලද මෙහි පහත දක්වෙන උප ලේඛනයෙහි සඳහන් මායිම්තුල පිහිටි ඉඩම වර්ෂ 1942 ජනවාරි මස 5වෙනි දින සිට නගහම් කැලයක් හැටියට මෙයින් සැලකිය යුතු බවයි.

උතුමාණන්වහන්සේගේ අණපරිදි,

වර්ෂ 1941ක්වූ සැප්තැම්බර් මස 30වෙනි දින කොළඹදීය.

ජී. ආර්. සඩ්බරි,
උතුමාණන්වහන්සේගේ ලේකම් වර්‍යා.

මහරජාණන්වහන්සේට දෙවියන්ගේ ආරක්ෂාව ලැබේවා !

උප ලේඛනය.

දකුණු දිසාවේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ නැගෙනහිර ගිරුවාපත්තුවේ කුඩාගොඩ, මිද්දෙනිය, සඳුගහයාය සහ වැලිපිටිය යන ගම්වලට අයත් අඩක 86 දරණ කැලෑ මැනීමේ මුල් සිතියමේ අඩක, 1, 3, 6, 7, 8, 10 සහ 11 දරණ කැබලිවලින් සහ අඩක 87 දරණ කැලෑ මැනීමේ මුල් සිතියමේ අඩක 1, 2 සහ 3 දරණ කැබලිවලින්ද යුක්තවූ, මෙහි පහත සඳහන් මායිම තුල පිහිටි මහජනයාගේ ප්‍රයෝජනය පිණිස තිබෙන මහපාරවල් සහ අඩිපාරවල්; හැර අක්කර 920කුත් රූඩ් 2කුත්, පර්චස් 39ක් ප්‍රමාණවූ මිද්දෙනියේ නගහම් කැලෑව නම් ඉඩම.

A කට්ටිය.—අඩක 86 දරණ කැලෑ මැනීමේ මුල් සිතියමේ අඩක 1, 3, 6, 7, 8, 10 සහ 11 දරණ මෙහි පහත සඳහන් මායිම් තුල පිහිටි, අක්කර 601කුත් පර්චස් 39ක් ප්‍රමාණවූ ඉඩම් :—

මායිම්—උතුරට: (F. V. P. 395) හෙල්ලල ගම් මායිම සහ සබරගමු පලාතේ මායිම;

නැගෙනහිරට: (F.V P. 402 දරණ සිතියමේ අංක 2 දරණ කැබැල්ල සහ T. P. 250,283 දරණ ඉඩම;

දකුණට: කටුවන සිට හුංගමට යන පුරපාර, F.V.P. 396 සිතියමේ 135 දරණ කැබෙල්ල සහ F. V. P. 402 සිතියමේ 2DQ දරණ ඉඩම.

බස්නාහිරට: F. V. P. 396 සිතියමේ අංක 135 දරණ ඉඩම.

B කට්ටිය—අඩක 87 දරණ කැලෑ මැනීමේ මුල් සිතියමේ අඩක 1, 2 සහ 3 දරණ, මෙහි පහත සඳහන් මායිම්තුල පිහිටි අක්කර 319කුත් රූඩ් 2ක ප්‍රමාණවූ ඉඩම් :—

මායිම්—උතුරට: F. V. P. දරණ සිතියමේ අඩක 31 දරණ ඉඩම් කැබෙල්ල ;

නැගෙනහිරට : කොලොන්නාකෝරළේට යන ගම්සභා පාර ;

දකුණට: F. V. P. 396 දරණ සිතියමේ අඩක 135KS, 135KT, 135KO, 135KN, 135KM, 135KH, 135KG, 135KF, 135KC, 135KB, 135KA, 135JU, 135JT, 135JS, 135JR, 135JO, 135JN, 135JJ, 135JI, 135OY, 135FH, (T. P. 419,592) සහ 135FI දරණ ඉඩම්කැබලිවලින් සහ කටුවණ සිට මිද්දෙනියට යන පුරපාර ,

බස්නාහිරට: F. V. P. 391 දරණ සිතියමේ අඩක 21 (T. P. 255,197), 19H (T. P. 303,203), 19BN (T. P. 431,943) 19BF (T. P. 400,997) සහ 19FG දරණ ඉඩම්කැබලි.

---

ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

Ratnapura No. 50.—සබරගමු දිසාවේ රත්නපුර දිස්ත්‍රික්කයේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1942ක්වූ පෙබරවාරි මස 10වෙනි දිනවූ අඟහරුවාද පෙරවරු 10ට රත්නපුරේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බදුදීමකරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෝජනාවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර පලාතේ කුරුවිටිකෝරළේ පිහිටා තිබෙන බිම්කැබලි 3ක්.

අන්තිම ගම් සිතියමේ නො. (F. V. P.) 330. ගම—එක්නැලිගොඩ.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකාරකියන්නා. | අන්දම. | මහන, අ. රූ. ප. | මූර ඉඩමේ තක්සේරු මිල, රු. |
|---|---|---|---|---|---|---|
| 51D | නාහිරිත්තෙහෙන .. | — .. | ආණ්ඩුව සහ ඊ. පැලිසා .. | සේන .. | 2 0 3 | 18* |

අන්තිම ගම් සිතියමේ නො. (F. V. P.) 56. ගම—කිවුරංගල.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකාරකියන්නා. | අන්දම. | මහන, අ. රූ. ප. | මූර ඉඩමේ තක්සේරු මිල, රු. |
|---|---|---|---|---|---|---|
| 146 | අඹගහවිලේවත්ත .. | — .. | ආණ්ඩුව ජී. ඊ. දන්තනාමී විසින් අයුත්තේ අල්ලාගෙන තිබෙන ඉඩම | රබර් ඉඩම, අවුරුදු 12යේ රබර්ගස් | 1 1 28 | 106 |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකාරයින්ගේ නම්. | අන්දම, | මහත, අ. රූ. ප. | මුළු ඉඩමේ තක්සේරු මිල, රු. |
|---|---|---|---|---|---|---|
| | | අවසාන ගම් සිතියමේ නො. (F. V. P.) 434. ගම—එදිරිකැලේ. | | | | |
| 280 | එදිරිකැලේමුකලාන.. | — | .. ආණ්ඩුව ජී. හොන්හෝ විසින් අයුත්තේ අල්ලාගෙන තිබෙන ඉඩම | වයස අවුරුදු අංචි කොස්, පුවක්, පොල් ආදි වැවිල්ල | 1 0 8 | 17 |

(* මේ 1932ක්වූ මාර්තු මස 7වෙනි දින මුද්‍රිත පණතෙන් පිට පැවැත්වූ වෙන්දේසියෙන් හිස තිබුනු මුදල් අයකර දෙන්ට යන ඉඩම.)

මෙම ඉඩම් ගැන වැඩිදුර කාරනා සබරගමු පලාතේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැක.

මේ 1941ක්වූ දෙසැම්බර් මස 10වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ වෙනුවට

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—සියඹලාපෙ වැලිවල අමුණ බැඳීම සඳහා මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ව්‍යවස්ථාවේ" 5වෙනි වගන්තියේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩු කාරක මහතුණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලයපිට කියිඅකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. P. P. A 1,383. ගම—යටියන්ත.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයින්ගේ නම්. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | සියඹලාපෙවත්ත .. | ඇලක්ද, ලී සහ යකඩ දොරවල් සවිකර තිබෙන කපරාරුකළ බැම්දෙකක්ද, කානු2කකොටස්ද ඇති අවුරුදු 5–50 වයස වගාව ඇති පොල් මිත්යක කොටසක් (වැමිලි නොමැතිබි) | ලුවිස් බුවුන් සහ සමාගම, කොළඹ.. | 0 0 10·8 |
| | | සිතියමේ නො. P. P. A 1,384. ගම—දරනෑගම. | | |
| 1 | හැඩුන්ගස්කුඹුර .. | පස්කන්ඩියක කොටසක් ඇති කුඹුර .. | කේ. ඒ. දොන් සාදිරිස් අප්පුහාමි, දරනෑගම | 0 1 15·2 |
| 2 | එම .. | මෙසන්වැඩකල අමුණක කොටසක්ද, මෙසන් වැඩකල සොරොව්වක්ද, පස්කන්ඩිවල කොටස්ද ඇති කුඹුර | ඇල්. සුරබියෙල් පෙරේරා, සැපුබොඩ, වැලිවේරිය | 0 0 24·5 |
| 3 | එම .. | මෙසන්වැඩකරහලද අමුණක කොටසක්ද, පස් කන්ඩිවල කොටස්ද, ආරක්ෂක ප්‍රාකාරයක්ද ඇති කුඹුර | ඒ. ඒ. දොන් චාර්ල්ස් අප්පුහාමි, නො. 323, මයවත්තපාර, මාදම්පිටිය, කොළඹ | 0 2 14·9 |
| 4 | එම .. | කුඹුර .. .. .. | එම .. .. | 0 0 5·3 |
| 5 | එම .. | එම .. | කේ. ඒ. දොන් ඉනෝසිස්අප්පුහාමි, දරනෑගම | 0 0 0·5 |
| 6 | වරකකුඹුර | පස්කන්ඩියක කොටසක් ඇති කුඹුර .. | ඇල්. ඩුම්පි පෙරේරා, ඉහලබෝම්රිය | 0 0 1·3 |
| 7 | සියඹලාපෙවත්තකුඹුර | මෙසන්වැඩකල සොරොව්වක් සහ පස්කන්ඩියක කොටසක්ද ඇති කුඹුර | ලුවිස් බුවුන් සහ සමාගම, කොළඹ . | 0 0 8·4 |
| | | සිතියමේ නො. P. P. A 1,385. | | |
| 1 | ඇවඹිගහවත්ත නො හොත් කෙලඹිගහ වත්ත | අවුරුදු 40ක්වයස පොල්ගස් 4ද, ඇලක්ද ඇති පොල් ඉඩම | එච්. ඇම්. නෙල්ලිස් පෙරේරා, දරනෑගම | 0 0 10·4 |
| 2 | එම .. | අවුරුදු 40ක වගාව ඇති (වැමිලි නැති) පොල් ඉඩම | ජේ. ඒබ්‍රහම් පෙරේරා, දෙස්කර් මහතා, නො. 85, තොටලඟ පාර, කොළඹ | 0 0 0·4 |
| 3 | ඉපුර .. | ඇලක් ඇති මිටි කැලෑව සහිත දෙනිබිම .. | එම .. .. | 0 0 14·3 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ හැටියට තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ හෝ ඇතැයි කියන්නාවූ නොයෙක් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය මේ 1942ක්වූ ජනවාරි මස 17වෙනි දින පෙරවරු 9.30ට මෙම කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ ඉඩම්වල අන්දමේ අයිතිවාසිකම්ද කියා සිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවෙන් ඉල්ලාසිටින මුදල් ගණනත් ඒම ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මේ 1941ක්වූ දෙසැම්බර් මස 15වෙනි දින කොළඹ කච්චේරියේදීය.

ඇල්. ජයසුන්දර,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත මහතා.

---

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—කොට්ටෙ සොහොන්භූමියට යාම ඊමට පාරක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ව්‍යවස්ථාවේ" 5වෙනි වගන්තියේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩු කාරක මහතුණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලය පිට කියිඅකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A 1,350. ගම—කොට්ටෙ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයින්ගේ නම්. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කොලදර්ච්චවත්ත .. | අවුරුදු 25ක් වයස පොල්ගස් 2ක්ද, අවුරුදු 15ක් වයස කොස්ගස් 2ක්ද ඇති පොල්ඉඩම | ගෞ. ජේ. බී. වෙල්කම්, කොට්ටෙ .. | 0 0 3·7 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ හැටියට තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ හෝ ඇතැයි කියන්නාවූ නොයෙක් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය මේ 1942ක්වූ ජනවාරි මස 17වෙනි දින පෙරවරු 11ට කොළඹ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ ඉඩමේ අන්දමේ අයිතිවාසිකම්ද කියා කියා සිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියා සිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මේ 1941ක්වූ දෙසැම්බර් මස 15වෙනි දින කොළඹ කච්චේරියේදීය.

ඇල්. ජයසුන්දර,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත මහතා.

(203වෙනි පරිච්ඡේදයේ 6වෙනි කාණ්ඩයේ ප්‍රකාරයට) ආණ්ඩුවේ කාර්යයක්සඳහා, එනම් :—203වෙනි පරිච්ඡේදයේ 5වෙනි කාණ්ඩයේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ ප්‍රකාර මඩකලපුවේ සිට ත්‍රිකුණාමලයට යන පාරේ 67¼ සැතැප්ම කනුව ලඟ පාර වෙනස්කිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනී සඳහා ක්‍රියාකාරණ පිණිස 5වෙනි කාණ්ඩයේ කරතිබෙන ප්‍රකාශයවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගේ කැමැත්ත පිට ප්‍රදේශ පාලනය පිළිබඳ විධායක කාර්‍ය සභාවෙන් නිසිආකාර මව අණ ලැබී තිබේ; ඒ ඉඩම් නම් :—

සිතියමේ නො. A 619. ගම—මූතූර.

| නො. | ඉඩමේ නම. | | අන්දම. | අයිතිකාරයින්ගේ නම. | මනන; අ. රූ. ප. |
|---|---|---|---|---|---|
| 1 | මූහතුවරනාවු | .. | මැනඩි එලිකල ඉඩම .. | ... ත්‍රිකුණාමලේ නගරයේ වන්නියනාර්වන වී. සරවනමුත්තු මහතා බාරේ කාලයාත්‍රාකල කදිරකාමතම්බි තම්බෝදුරම් පිල්ලේගේ උරුමක්කාරයෝ | 0 0 10·3 |
| 2 | එම | .. | ගල්පාරක්ද, අවුරුදු 2ක් වයසැති මුරුන්ගා ගස් 2ක්ද, අවුරුද්දක් වයසැති පැපොල් ගහක්ද ඇති මැනඩි එලිකල ඉඩම | එම .. .. | 0 1 1 |
| 5 | එම | .. | මැනඩි එලිකල ඉඩම .. ... | එම .. .. | 0 0 30·2 |
| 6 | එම | .. | ගල්පාරක්ඇති මැනඩි එලිකල ඉඩම .. | එම .. .. | 0 2 2·2 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැනීම සඳහා 6වෙනි වගන්තියේ ප්‍රකාර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ හැමදෙනම නමුත්ම නොහොත් නමුන් වෙනුවට ක්‍රියාකාරණ අය මම 1942ක්වූ ජනවාරි මස 20වෙනි දින උදේ 11ට කාලයට ත්‍රිකුණාමලේ කච්චේරියේදී මා ඉදිරිපිටම පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියා සිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවෙන් ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ නමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මම 1941ක්වූ දෙසැම්බර් මස 16වෙනි දින
ත්‍රිකුණාමලේ කච්චේරියේදීය.

සී. ජේ. බ්‍රින් ලැන්ස්ට්‍රි,
ආණ්ඩුවේ උප ඒජන්ත වමයා.

---

## රජසන්තක රබර් ඉඩම් බදුදීම.

L W 5265

සබරගමු පලාතේ රත්නපුර දිස්ත්‍රික්කුවේ පිහිටි මෙහි පහත සඳහන් රජසන්තක රබර් ඉඩම්වල 1943ගේ දෙසැම්බර් මස 31වෙනි දින දක්වා කිරිකපා ප්‍රයෝජනගැනීමේ බලය ඉල්ලා එවන්ට යෙදෙන ඉල්ලුම්පත්‍ර සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් බාරගනු ලැබේ. මෙම ඉඩම් ආණ්ඩුව විසින් රිජිස්ටර්කර තිබේ.

2. "Tenders for the right to take the produce of rubber taees" එනම් "රබර්ගස්වල කිරිකපා ප්‍රයෝජන ගැණීමට බලය ඉල්ලම්කරන ඉල්ලුම්පත්‍රය" යන වචන ඇන්විලොප් එකේ මතු පිට ලියනලද මුද්‍රලන් ඉල්ලුම්පත්‍ර මම 1942ක්වූ ජනවාරි මස 16වෙනි දින පෙරවරු10 වනතුරු බාරගෙන කඩාබලනවා ඇත. ඉල්ලුම්කාරයෝ ඉදිරිපිට සිටින්ට ඕනෑය. එසේ නැත්නම් නිසි බලයලත් ඒජන්ත කෙනෙකු හෝ ඒජන්තවරු ලවා ඉල්ලුම්පත්‍ර හරි ඒවා බව ඔප්පුකරන්ට ඕනෑය.

3. යම් ඉල්ලුම්පත්‍රයක් බාරගැනීමේ හෝ නොගැනීමේ බලය ඒජන්තතුමා වෙත තබාගන්නාලදී.

4. ඒජන්තතුමා විසින් භාරගන්නාලද ඉල්ලුම්පත්‍ර අයිති කාරයෝ ඉල්ලුම්පත්‍රවල සඳහන් මුදලෙන් ¼ කොටසක් එවලේම ගෙවන්ට ඕනෑය. ඉතුරු මුදල් 1943ගේ ජනවාරි මස පළමු වෙනිදට මත්තෙන් ගෙවන්ට ඕනෑය.

5. කැලෑවට යන්වනොදී ඉඩම් හොඳ අන්දමින් තබාගැනීමට බදුකාරයා වගකිය යුතුය.

6. උවමනාකරණ කානු සහ වලවල් ආදිය කපා ඉඩමේ පස් සෝදායාම වැලැක්විය යුතුය.

7. බද්ද අවසානවූ විගාම හෝ අවලංගුකලවිට බදුකාරයා වගාවට අනතුරුනොකර ඉඩම නිරවුල්ව භාරදිය යුතුයි.

8. කුපන්දීම සඳහා කාරනා රබර්පාලකතුමාගෙන් දැනගත යුතුයි.

9. රබර්පාලකතුමා විසින් නියමකළහොත් ඉඩම් පරීක්‍ෂා කිරීමට සහ නක්ෂේරුකිරීමට යන මුදලක් බදුකාරයා විසින් ගෙවිය යුතුය.

10. වැඩිදුර කාරනා සබරගමු පලාතේ ඒජන්තතුමාගෙන් ලබාගත හැක.

ඩී. වනසුන්දර,
සබරගමු පලාතේ මහා ඒජන්තතුමා වෙනුවට.

මම 1941ක්වූ දෙසැම්බර් මස 15වෙනි දින
රත්නපුරේ කච්චේරියේදීය.

ගම—අයගම, කුකුළුකෝරළය.

| නො. | රෙජිස්ටර් නො. | | ඉඩම්වල විස්තර. | බිම්කරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | 193E3R45 | .. | ලොට් නො. 147 සහ 149, F. V. P. 42 | 10 | 1 | 30 |
| 2 | 193E3R47 | .. | ලොට් නො. 174 සහ 184, F. V. P. 42 | 125 | 0 | 0 |
| 3 | 193E3R11 | .. | ලොට් නො. 922A, 841P, 832T, 832L, F. V. P. 42. | 18 | 2 | 27 |
| 4 | 193S3R198 | .. | ලොට් නො. 883B, 926A සහ 926B, F. V. P. 42 | 2 | 3 | 34 |
| 5 | 193S3R206 | .. | ලොට් නො. 510½A, 177A සහ 190X, F. V. P. 42 | 3 | 1 | 33 |
| 6 | 193S3R209 | .. | ලොට් නො. 57A සහ 57B, F. V. P. 42 | 0 | 1 | 29 |
| 7 | 193S3R217 | .. | ලොට් නො. 88A, F. V. P. 42 | 0 | 3 | 17 |
| 8 | 193S3R214 | .. | ලොට් නො. 681, F. V. P 42 | 1 | 3 | 0 |
| 9 | 193S3R200 | .. | ලොට් නො. 541D, F. V. P. 42 | 1 | 1 | 1 |
| 10 | 193S3R202 | .. | ලොට් නො. 118D සහ 252, F. V. P. 42 | 4 | 2 | 2 |
| 11 | 193S3R208 | .. | ලොට් නො. 58A, 58B, 58C, 58D, 58E සහ 62A, F.V.P. 42 | 4 | 0 | 37 |
| | | | ගම—ගවරගිරිය. | | | |
| 12 | 193E3R51 | .. | ලොට් 592, V. P. 41 .. | 10 | 3 | 8 |
| 13 | 193S3R232 | .. | ලොට් 478J, V. P. 41 .. | 0 | 1 | 19 |
| 14 | 193S3R229 | .. | ලොට් 613, V. P. 41 .. | 1 | 1 | 20 |
| | | | ගම—පිඹුර. | | | |
| 15 | 194S3R149 | .. | ලොට් 131L, F. V. P. 241 .. | 0 | 0 | 36 |
| 16 | 194S3R150 | .. | ලොට් 131M, F. V. P.241 .. | 0 | 0 | 14 |
| 17 | 194S3R165 | .. | ලොට් 109, F. V. P. 241 .. | 3 | 3 | 1 |
| 18 | 194S3R166 | . | ලොට් 109A, 133B, 133D 131N, සහ 131 O, F. V. P. 241 | 5 | 2 | 32 |
| | | | ගම—පෙප්ඩිකන්ද. | | | |
| 19 | 196S3R89 | .. | ලොට් 24, F. V. P. 243 .. | 0 | 1 | 0 |
| | | | ගම—ගෙදගල. | | | |
| 20 | 194E3R28 | .. | ලොට් 4L, F. V. P. 240 | 14 | 2 | 26 |
| | | | ගම—පරගල. | | | |
| 21 | 194E3R29 | .. | ලොට් 346D, F. V. P. 224 .. | 18 | 0 | 22 |
| | | | ගම—ඇරැපොල කුරුවිටිකෝරළය. | | | |
| 22 | 1942S1R269 | .. | ලොට් 206, F. V. P. 223 .. | 1 | 0 | 0 |
| | | | ගම—එපිටවල. | | | |
| 23 | 145S1R359 | .. | ලොට් 15DX, F. V. P. 158 .. | 0 | 0 | 30 |
| | | | ගම—නුගෙදණ දහදිකැලේ. | | | |
| 24 | 143S1R250 | .. | ලොට් 41, F. V. P. 217 .. | 0 | 2 | 0 |
| | | | ගම—එඹුරියන්වල. | | | |
| 25 | 160S1R35 | .. | ලොට් 345, 347, සහ 330, V. P. 334 | 3 | 1 | 26 |
| | | | ගම—දෙහිපගල. | | | |
| 26 | 160S1R42 | .. | ලොට් නො. 25A, 58A සහ 65F, V. P. 331 | 7 | 2 | 10 |
| | | | ගම—ඕපනායක, මැදකෝරළය. | | | |
| 27 | 245S6R21 | .. | ලොට් නො.562C, F.V.P. 201 | 0 | 0 | 15 |

---

## මැණිකර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

L. R. 2321

සබරගමු පලාතේ රත්නපුර දිස්ත්‍රික්කුවේ පිහිටි මෙහි පහත සඳහන් රජසන්තක ඉඩම්වල අවුරුද්දක්තුළ මැණික් හෑරීමේ බලය ඉල්ලා එවන්ට යෙදෙන ඉල්ලුම්පත්‍ර සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් භාරගනු ලැබේ.

2. "Tender for the Right to Gem" එනම් "මැණික් හෑරීමේ බලය ඉල්ලුම්කරන ඉල්ලුම්පත්‍රය" යන වචන ඇන්විලොප් එකේ මතුපිට ලියනලද මුද්‍රලන් ඉල්ලුම්පත්‍ර මම 1942ක්වූ

ජනවාරි මස 17වෙනි දින පෙරවරු 10.30ට වනතුරු භාර ගනිමින් කඩාබලනවා ඇත. ඉල්ලුම්කාරයෝ ඉදිරිපිට සිටින්ට ඕනෑය. එසේ නැත්නම් නිසි බලයලත් ඒජන්ත කෙනෙක් හෝ ඒජන්තවරු ලවා ඉල්ලුම්පත්‍ර හරි ඒවා බව ඔප්පුකරවන්ට ඕනෑය.

3. ඒජන්ත උන්නාන්සේ විසින් භාරගන්නාලද ඉල්ලුම්පත්‍ර අයිතිකාරයෝ ඉල්ලුම්පත්‍රවල සඳහන් මුදල් සම්පූර්ණයෙන් එවෙලේම ගෙවන්ට ඕනෑය. තවද කොන්දේසි පිළිපැදීම ආදිය සඳහා බදු අවසරපත්‍රයකට ඇතුල්වෙන්ට ඕනෑය.

4. ඉල්ලීම භාරගත් දින සිට මාසයක් ඇතුළතදී ඉල්ලුම්කාරයා විසින් බදු අවසරපත්‍රයක් ලබානොගත්තොත් නම් ඔහු විසින් ගෙවනලද මුදල රජසන්තක වෙනවා ඇත.

5. බද්ද වලංගු කාලයතුළ බදුදෙන්ට යෙදුන ඉඩමේ ඇති ගස්වලට යම් අලාභයක් සිදුවෙන්ට හෝ නැතිනම් ඉදිරිවැටෙන්ට යෙදුනොත් එකී ගස්වල වටිනාකම බදුකාරයා විසින් ගෙවිය යුතුයි.

6. යම් ඉල්ලුම්පත්‍රයක් හෝ ඉල්ලුම්පත්‍ර සියල්ලම භාරනොගැනීමේද ඉල්ලුම්පත්‍රයක යම් කොටසක් භාරගැනීමේද බලය සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ වෙත තබාගන්නාලදී.

7. භාරගන්නාලද ඉල්ලුම්පත්‍ර අයිතිකාරයන් විසින් තම තමන් ඉල්ලුම්කරණලද ඉඩම්වල පතල් ගොඩකිරීමාදියට සහ අවසරපත්‍රයේ කොන්දේසි කඩකිරීම වැලක්වීමටත් සබරගමු පලාතේ ඒජන්ත උන්නාන්සේ විසින් නියමකරන්ට යෙදෙනලද රුපියල් සියයකට (රු. 100) වැඩිනොවන මුදලක් එක එක ඉඩමට ඇප වශයෙන් කච්චේරියේ බඳින්ට ඕනෑය.

8. එක එක ඉඩමට වෙන් වෙන් වශයෙන් ඉල්ලුම්පත්‍ර එවන්ට ඕනෑය.

9. ඉඩම් ඉල්ලුම්කාරයෝ තම තමන් ඉල්ලුම්කරණලද ඉඩම්වල වැඩපටන්ගන්නා දින සහ වැඩ නවත්වන දිනද කොළඹ ලෝහ පරීක්ෂකතුමා වෙත දන්විය යුතුයි. තවද එකී ලෝහ පරීක්ෂකතුමා පතල් විභාගයට ආවිට සියලුම පතල්වල වැඩ නවත්වා පරීක්ෂාකිරීමට ඉඩදිය යුතුයි.

10. මෙම ඉඩම්වල බිම් ප්‍රමාණය පෙන්නුම්කර තිබෙන්නේ සාමාන්‍ය වශයෙනි. යම් අයුරකින් ඉඩම්වල හරි සම්පූර්ණ බිම් ප්‍රමාණය මෙහි පහත සඳහන් බිම් ප්‍රමාණයට වඩා අඩු බව දෙවනු පෙනීගියහොත්, එම වෙනස සියයට 10ක් (10%) වැඩි නුනිනම් බිම් ප්‍රමාණයේ අඩුලුහුඩුකම සම්බන්ධව මුදල් ආපසු ගැනීමට හෝ අඩුකරගැනීමට කරණ ඉල්ලීම ආණ්ඩුව විසින් කල්පනාවට ගණු නොලැබේ.

11. වැඩිදුර කාරණ සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් ලබාගත හැකිවේ.

ඉඩම්වල තොරතුරු.

(1) නව්දුන්කෝරලේ මාරපන පිහිටි රූඩ් 3ක් පමණ විශාලකම ඇති F. V. P. 92 ප්ලෑනේ ලොට් 115J එකේ බ්ලොක් X දරන මහඉත්තෑවේමුකලාන වැව්ගාවාකැලේ නැමති ඉඩමට මායිම්:—

උතුරට: ලොට් 117,
නැගෙණහිරට: ලොට් 115H,
දකුණට: ලොට් 115–J එකේ බ්ලොක් Y,
බස්නාහිරට: ලොට් 115–I.

(2) නව්දුන්කෝරලේ මාරපන පිහිටි ඇක්කර 1½ක් පමණ විශාලකම ඇති F. V. P. 92 ප්ලෑනේ ලොට් නො. 115J එකේ බ්ලොක් Y දරන මහඉත්තෑවේමුකලාන වැව්ගාවාකැලේ නැමති ඉඩමට මායිම්:—

උතුරට: ලොට් නො. 115J බ්ලොක් X,
නැගෙනහිරට: ලොට් 115F,
දකුණට: ලොට් නො. 115J බ්ලොක් Z,
බස්නාහිරට: ලොට් 115I.

(3) නව්දුන්කෝරලේ මාරපන පිහිටි ඇක්කරයක් පමණ විශාලකම ඇති F. V. P. 92 ප්ලෑනේ ලොට් නො. 115J එකේ බ්ලොක් Z දරන මහඉත්තෑවේමුකලාන වැව්ගාවාකැලේ නැමති ඉඩමට මායිම්:—

උතුරට: ලොට් 115J බ්ලොක් Y,
නැගෙනහිරට: ලොට් 115F,
දකුණට: ලොට් 115J එකේ ඉතුරු කොටස,
බස්නාහිරට: 115I.

ඩී. වනසුන්දර,
සබරගමු පලාතේ මහා ඒජන්ත
උන්නාන්සේ වෙනුවට.

වර්ෂ 1941ක්වූ දෙසැම්බර් මස 16වෙනි දින
රත්නපුර කච්චේරියේදීය.

---

## රා සහ අරක්කු තැබෑරුම් සම්බන්ධ වර්ෂ 1912ගේ අංක 8 දරණ ව්‍යවස්ථාව යටතේ දැන්වීමයි.

### රත්නපුර දිස්ත්‍රික්කයේ ගලගම (බෙලිහුල්ඔය) අරක්කු සහ රා තැබෑරුම් විවෘතකිරීම ගැන ඒ පලාත්වාසීන්ගේ අදහස දැනගැනීම සඳහා ඡන්ද විමසීම ගැන දැන්වීම.

සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්තතුමා ස්වදේශ කටයුතු භාර විධායක සභාවේ නියමය පිට පහත සඳහන් දින වේලාව සහ ස්ථානය ගලගම අරක්කු සහ රා තැබෑරුම්වලට නියමිත කොට්ඨාශයේ ඡන්ද ලැයිස්තුවේ සඳහන් අයගෙන් ඡන්දදීම පිණිස පැමිණ ඡන්දදෙන් අයගෙන් සියයට 51ක් එකී තැබෑරුම් විවෘතකිරීමට කැමතිද යන්න දැනගැනීම පිණිස නියමකල බැව් මෙයින් දැනුම්දෙමි.

විවෘතකිරීමට සතුටු අයද විරුද්ධ අයද දෙපක්ෂයම පැමිණ ඡන්දදෙන්ට උවමනා බැව් මෙයින් දන්වමි. තවද ඡන්ද විමසීමේ ප්‍රතිඵල ක්‍රියාවේ යෙදවීමට ස්වදේශ කටයුතු භාර විධායක සභාව බැඳීනැති බැව් මෙයින් ප්‍රකාශකරමි.

| තැබෑරුමේ නම. | ඡන්ද දීමේ වේලාව සහ දිනය. | ඡන්දය දෙන ස්ථානය. | කොට්ඨාශය. |
|---|---|---|---|
| (1) ගලගම අරක්කු තැබෑරුම, (2) ගලගමරා තැබෑරුම | 1942ක් පෙබරවාරි මස 2වෙනි දින උදේ 8 සිට දවල් 12 දක්වා සහ සවස 1ක් සිට 6 දක්වා | ගලගම ගම්සභා උසාවිය | මුත්තෙට්ටුවගම ගම් මුලාදැනියාගේ කොට්ඨාශයේ කරගස්තලාව, කිඹිල සහ පඹහින්න, පහළ ගලගම ගම් මුලාදැනියාගේ කොට්ඨාශයේ උඩ බැද්දෙපිටවෙල, කුඹුරුතැකිවෙල, අස්සැද්දුන් වෙල, යක්දෙකිවෙල, වලකඩවෙල, මැද්දෙ හිතිවෙල, බෝගහකුඹුරුවෙල; ගල්අරාව සහ පහළ ගලගම සහ සීලෝගම ගම් මුලාදැනියාගේ කොට්ඨාශයේ සීලෝගම බිම්තැනිගොල්ල පූවක් ගස්අරාව, අගලගම, යටි අගලගම සහ මුංවතාය |

2. මෙය අදහස දැනගැනීමේ ඡන්දයක් බැව් ඡන්දදායකයින් විශේෂයෙන් සැලකිය යුතුයි.

3. 1941ක් නොවැම්බර් මස 14වෙනි දින නො. 8,812 දරණ ගැසට් පත්‍රයේ සහ එදින දිනමිණ පත්‍රයේත් මේ සම්බන්ධ පළවූ දැන්වීම මෙයින් අවලංගුකරනලදී.

1941 දෙසැම්බර් මස 13වෙනි දින
රත්නපුර කච්චේරියේදීය.

ආර්. ඇම්. ඩේවිස්,
සබරගමු පලාතේ ඒජන්තතුමා.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO